දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2012 පරීක්ෂණය - 2014 දෙසැම්බර්
Bachelor of Arts General (External) Degree Part II 2012 Examination – December 2014

භූවිසා 3.2 - ප්‍රාදේශීය භූගෝල විද්‍යාව
GYG 3.2 - Regional Geography

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. "ප්‍රදේශ" (Region) පිළිබඳ ව භූගෝල විද්‍යා විෂයෙ හි ඉදිරිපත් වී ඇති මත හා අදහස් විවේචනාත්මක ව විමසන්න.

(ලකුණු 20 යි)

02. (i) "ප්‍රදේශ" සීමා නිර්ණය සඳහා යොදාගත හැකි අවිධිමත් හා විධිමත් ප්‍රවේශයන් කවරේදැයි දක්වන්න.

(ලකුණු 05 යි)

(ii) ඔබ නම්කල විධිමත් ප්‍රවේශ අතුරින් එක් ප්‍රවේශයක්, කල්පිත දත්ත හා සටහන් පාදක කර ගනිමින් සීමා නිර්ණය කර දක්වන්න.

(ලකුණු 12 යි)

(iii) ඔබ ඉදිරිපත් කළ ප්‍රවේශයේ ප්‍රායෝගික වැදගත්කම පහදන්න.

(ලකුණු 03 යි)

03. "ප්‍රාදේශීය වශයෙන් බලනවිට ශ්‍රී ලංකාවෙහි විද්‍යමාන වන්නේ පුළුල් ලෙස ව්‍යාප්ත වූ ක්ෂේත්‍රීය විෂමතාවකි." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නෙ හි ද?, ඔබේ පිළිතුර ප්‍රමාණවත් සාධක හා හේතු පාදක කර ගනිමින් සත්‍යයෝක්ෂණය කරන්න.

(ලකුණු 20 යි)

04. වර්තමානයේ ප්‍රාදේශීය අනුකලන (Regional Integration) ගොඩ නැගීමේ අරමුණු කවරේදැයි පැහැදිලි කරමින්, සාර්ක් (SARRC) සංවිධානය කොතෙක්දුරට ඊට අනුගත වී ඇද්ද යන්න විභාග කරන්න.

(ලකුණු 20 යි)

05. (අ) මානව සංවර්ධන දර්ශකය (Human Development Index) අන්තර්ගතයන් සකස් කරන්නේ කෙසේදැ යි පහදන්න.

(ලකුණු 05 යි)

(ආ) "මානව සංවර්ධන දර්ශක අගය ඉහල රටවල් ආර්ථික අතින් ද ශක්තිමත් රටවල් වේ." නිදසුන් සහිතව විවේචනාත්මකව පහදන්න.

(ලකුණු 15 යි)

06. (අ) තිරසාර සංවර්ධනය (Sustainable Development) යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05 යි)

(ආ) තිරසර සංවර්ධන ක්‍රියාවලිය තුළ අන්තර්ගත ප්‍රවේශයන් මොනවාදැයි විස්තරාත්මක විග්‍රහයක්, විමර්ෂණය කරන්න.

(ලකුණු 15 යි)

07. "ආසියාන් (Asean) සංවිධානයට අයත් රටවල් කිහිපයක් නව කාර්මික රටවල් ලෙස මතුවෙමින් පවතී." ඉහත ප්‍රකාශය උචිත නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

08. සංචාරක කර්මාන්තයේ සුවිශේෂී අංගයක් ලෙස පාරිසරික සංචාරක කර්මාන්තය (Eco tourism) මගින්, ප්‍රාදේශීය විෂමතා අවම කළ හැකි ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡